# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,941- 2015 නොවැම්බර් මස 13 වැනි සිකුරාදා - 2015.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1938 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1940 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1945 |


*සැ. යු.* - විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 දෙසැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1937- B 81001 - 5,402 (2015/11)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2016***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2015.12.01 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | ගම්පහ | ගම්පහ මීනුවන්ගොඩ | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, කිරුළ පාර, කොළඹ 05. | ගම්පහ | 2016.01.01 |
| දකුණු පළාත | මාතර | මාතර බිම්සවිය | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල | මාතර | 2016.01.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතුය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2015.12.01 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2016*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2016**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.

2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර ? : ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.
11. ප්‍රධාන මාර්ගයට පිවිසීමට ගත වන කාලය : ____________.
12. මනාව සැකසුණ සනීපාරක්ෂක තත්වය (විස්තර සහිතව) : ____________.
13. දුරකථන පහසුකම් තිබේ නම් දුරකථන අංකය : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

11-303

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**ගම්පොළ සහ කටුගස්තොට අතර, (දුම්රිය ස්ථාන දෙකම ඇතුළුව) රාත්තල් 88 පීලි සඳහා පීලි දෙක අතර පුළුල් පරතරයක් ඇති කොන්ක්‍රීට් සිල්පර 10,000ක් මිලදී ගැනීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7259

01. ගම්පොල සහ කටුගස්තොට අතර (දුම්රිය ස්ථාන දෙකම ඇතුලුව) රාත්තල් 88 පීලි සඳහා කොන්ක්‍රීට් සිල්පර 10,000ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1 දරන ස්ථානයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් දේශීය නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015.11.12 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් පස්වරු 2.00 ට අවසන් වෙයි.

03. ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් වශයෙන් රු. 2,500.00 ක මුදලක් ගෙවීමෙන් 2015.10.20 සිට 2015.11.11 දින දක්වා පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා වූ කාලය තුළ සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළ දී ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසුභාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 1 දරන ස්ථානයෙහි ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු අතර, එසේ නොමැති නම් මේ සඳහා තබා ඇති පෙට්ටියෙහි බහාලිය යුතු ය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් බාරේ,
අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරි ගාස්තු ගෙවීමකින් තොරව සිදු කළ හැකි ය.

07. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
යොමු අංකය : SRS/F.7259

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

11-348

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අම්බලන්ගොඩ පොලිස් නිවාස අංක 15 දරන ස්ථානයේ පදිංචි පෙතංගොඩගේ අනුර ජයන්ත වන මා විසින් වාද්දූවේ ගුණතිලක පටුමග අංක 20/19 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට ඇල්පිටියේ පන්ගන්විල 9 සැතපුම් කණුව පදිංචි කනත්ත කංකානම්ගේ ප්‍රියදර්ශනී මහත්මියට මා විසින් ලබා දී ඇති 2008.05.16 වැනි දින බී. එච්. හේමරත්න පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ අංක 29017 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කරන බව දන්වා සිටිමි.

පී. අනුර ජයන්ත.

11-207

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර එස් ඒ එම් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම හි නාමය එස් ඒ එම් ඉනොවේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් 2015 මැයි 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙර සමාගමේ නම : එස් ඒ එම් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 101400
ලියාපදිංචි කාර්යාලය : 409, 3 වන මහල, ගාලු පාර, කොළඹ 3
නව නාමය : එස් ඒ එම් ඉනොවේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

409, 3 වැනි මහල,
ගාලු පාර,
කොළඹ 03.

11-211

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ෆෝන් සෙල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 60782
ලියාපදිංචි කාර්යාලය : අංක 6 7/8, නිදහස් මාවත, හෙට්ටියාවත්ත, රාගම
ලියාපදිංචි කළ දිනය : 2007.07.26

සමාගමේ ලේකම්වරු.

11-219

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : වංශ කුවේරා (පීවීටී) එල්ටීඩී
අංකය : පී. වී. 109281
ලියාපදිංචි කළ දිනය : 2015.10.21
ලියාපදිංචි ලිපිනය : අංක 596/5, පත්තිනිවත්ත, පෝරේ, අතුරුගිරිය.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
නීතිඥ සමාගමේ ලේකම්,
වංශ කුවේරා (පීවීටී) එල්ටීඩී.

11-225

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඒ. බී. සී. සෙකියුරිටි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108444
සංස්ථාගත කළ දිනය : 2015.09.17
ලිපිනය : අංක 101, නුවර පාර, දළුගම, කැලණිය

සමාගම් ලේකම්.

11-226

## ප්‍රසිද්ධ නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : රථ්ලි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101686
ලියාපදිංචි ලිපිනය : රථ්ලි ෆාම්, රජවැල්ල
සංස්ථාපනය කළ දිනය : 2014.10.24

සමාගම් ලේකම්.

11-229

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර පහත සඳහන් නම වෙනස් කිරීම මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ කලින් නම : ලයිනර් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 100367
සමාගමේ ලියාපදිංචි ලිපිනය : ලෙවල් 6, පාක්වේ ගොඩනැගිල්ල, උද්‍යාන පාර, කොළඹ 02
සමාගමේ නව නම : ලීනියර් පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලීනියර් පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා හා වෙනුවෙන්

ජේසී සහ සමාගම,
ලේකම්වරු.

11-230

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : හිරෝහමා සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 109234
සංස්ථාගත දිනය : 2015.10.19
ලියාපදිංචි ලිපිනය : අංක 48 බී, පාක් වීදිය, කොළඹ 2

ජෙසී ඇන්ඩ් කොම්පැනි සමාගම්,
ලේකම්වරුන්.

අංක 9/5, තම්බයියා ඇවනියු,
කොළඹ 7.

11-231

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : වීවීෆෝරියා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107905
ලියාපදිංචි ලිපිනය : 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015.09.08

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-233

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම පිළිබඳ නිවේදනය

එක්සත් රාජධානියෙහි , එච්ඒ 8 6 ඩීපී, මිඩ්ල්සෙක්ස්, එජ්වෙයාර්, ටෙන්බි පාර, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි , අංක එන් 1889500 දරන ගමන් පත්‍රය හිමි, කොටුවිල කන්කානමලාගේ මයිකල් රොහාන් ලෙනින් පෙරේරා වන මම මොරටුව, මොරටුමුල්ල, පුවක්ගහ තොටුපල පාරේ, අංක 18/1 හි පදිංචි කොටුවිල කන්කානමලාගේ මයිකල් රොහාන් ලෙනින් පෙරේරා ලියොනි සුජාතා ශිරන්ති පෙරේරා මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කළ, ප්‍රසිද්ධ නොතාරිස් නිර්මල පෙරේරා විසින් සහතික කරන ලද අංක 301 හා 2003.09.30 දින දරන ඇටෝර්නි බලපත්‍රය 2015.10.23 දින සිට ක්‍රියාත්මක පරිදි අවලංගු කරන ලද බවත් එදින සිට එකී ඇටෝර්නි බලපත්‍රකරු විසින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට මා බැඳී නොමැති බවත් ශ්‍රී ලංකා ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොටුවිල කන්කානමලාගේ මයිකල්
රොහාන් ලෙනින් පෙරේරා
(ප්‍රධාන ඇටෝර්නි)

11-234

### සමාගමේ නාමය වෙනස් කිරීම දැනුම්දීමයි

PV 89329 ZAK PRINT (PRIVATE) LIMITED සමාගමේ නාමය 2015.09.02 දින සිට PRINTEC LANKA (PRIVATE) LIMITED ලෙස වෙනස් කර භාවිතා කරන බවට මහජනතාවටත් ශ්‍රී ලංකාණ්ඩුවටත් මෙයින් දැනුම් දෙමු.

කළමණාකාරිත්වය
PRINTEC LANKA (PRIVATE) LIMITED

11-238

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : එම් ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 109299
දිනය : 2015.10.21
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/311

11-256

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : ශ්‍යාමා ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107422
සංස්ථාගත කළ දිනය : 2015.07.30
ලිපිනය : අංක 121 1/14, 1 වැනි හරස් වීදිය, කොළඹ 11.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-258

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : රංතාලිය නිව් රෙස්ට් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106368
සංස්ථාගත කළ දිනය : 2015.06.17
ලිපිනය : අංක 11, සවුත් ලේක් රවුන්ඩ්, කුරුණෑගල.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-259

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : විලච් රෙස්ට් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106366
සංස්ථාගත කළ දිනය : 2015.06.17
ලිපිනය : අංක 01, බීච් රෝඩ්, හලාවත.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-260

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : ග්‍රීන් පැලස් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106374
සංස්ථාගත කළ දිනය : 2015.06.17
ලිපිනය : අංක 183, කුරුණෑගල පාර, හෙට්ටිපොල.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-261

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : ග්ලෝබල් හෙල්ත් කොකනට් ප්‍රොඩක්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107483
සංස්ථාගත කළ දිනය : 2015.08.04
ලිපිනය : අංක 233/2, හෙයියන්තුඩුව, මාබිම, බියගම 11618 ශ්‍රී ලංකා

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-262

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සීමිත වගකීමෙන් යුත් පුද්ගලික සමාගමක් ලෙස සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඒ. බී. එම්. එක්සිම් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 49/16, වාලුකාරාම පාර, කොළඹ 3
ලියාපදිංචි අංකය සහ දිනය : පී වී 108362 2015.09.18

සමාගම් ලේකම්.

2015.10.16

11-266

## ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් පෞද්ගලික සීමිත වගකීම් සහිත සමාගම් 2014 දෙසැම්බර් මස 10 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අල්ට්මෝ ඉන්ඩස්ට්‍රියල් සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 102720
ලියාපදිංචි කාර්යාලය : අංක 03, පළමුවන මහළ, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

11-267

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : කන්සර්මන් ශ්‍රී ලංකා ෆවුන්ඩේෂන්
සමාගමේ ලියාපදිංචි අංකය : ජී ඒ 2497
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 546/8, දළුවකොටුව, කොච්චිකඩේ

සමාගමේ නව නාමය : කන්සර්මන් එස් එල් ෆවුන්ඩේෂන්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2015 සැප්තැම්බර් මස 30 වැනි දින

ආර්. කේ. එල්. එස්. කෝපරේට්
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-269

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධාන අනුව සමාගමේ නම වෙනස් කිරීම මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ආර් ඇන්ඩ් ආර් ප්ලෙෂර් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
R & R PLEASURE (PRIVATE) LIMITED
සමාගමේ අංකය : පී වී 85996
ලියාපදිංචි කාර්යාලය : 26/ඩී, සමුළු නිවාස, කොළඹ 5
සමාගමේ නව නාමය : වයිල්ඩ් බීච් රිසෝර්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
WILD BEACH RESORTS (PRIVATE) LIMITED

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

නීතිඥ නන්දන එදිරිසිංහ,
ලියාපදිංචි සමාගම් ලේකම්.

11-279

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වැල්ලවත්ත, හික්කඩුව හි පදිංචි (වර්තමානයේ Via Giacome 11 lumbroso 00151 Rome Italy) කපුගේ සමන් ප්‍රියන්ත යන අය රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ 2015-07-27 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් බද්දේගම, වවුලගල, ස්වර්ණපුර හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 776460257 V හිමි වන්නි ආරච්චි රුචිනි දිලේකා සමන්ති වන මා වෙත පවරන ලද එකී විශේෂ ඇටර්නි බලය වර්ෂ 2015ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

2015 ඔක්තෝබර් මස 26 වැනි දින.

11-302

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

නැගෙනහිර තෙල්ලි අඩි මුදකඩු, කරාවෙඩ්ඩි හි පදිංචි ප්‍රේමා සර්වානන්දන් වන මා විසින් තෙල්ලිඅඩි නැගෙනහිර, මුදකඩු, කරවෙඩ්ඩි හි පදිංචි රාසයියා සර්වානන්දන් වෙත ප්‍රදනය කරන ලද චන්ද්‍රාවතනී වාසවන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 2012.01.22 දිනැති අංක 220 දරන ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

ප්‍රේමා සර්වානන්දන්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
තෙල්ලිඅඩි නැගෙනහිර, මුදකඩු, කරවෙඩ්ඩි.

11-347

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ ප්‍රකාරව, පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : රයිස් ඕෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 108720
ලියාපදිංචි ලිපිනය : 147/11, ලයන් සිටි, සීදූව
සංස්ථාගත කළ දිනය : 2015.09.29

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

11-360

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : එලයිඩ් මෙටල්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105552
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2015 මැයි 20

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

11-361

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්ති ප්‍රකාරව පහත නම් සඳහන් සමාගමේ නාමය 2015 අගෝස්තු මස 14 වැනිද සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ පෙර නාමය : සින්ක් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : සී. ජී. හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82353
ලියාපදිංචි කාර්යාල ලිපිනය : 2 වැනි මහල, ඒ ඊ සී ගොඩනැගිල්ල, අංක 140, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-362

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගමේ නාමය 2015 අගෝස්තු මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇති බැව් මෙයින් දැනුම් දෙමු.

පෙර නම : සින්ක් හොස්පිටලිටි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
අලුත් නම : සීජී හොස්පිටලිටි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 81355
ලියාපදිංචි ලිපිනය : 2 වැනි මහල, ඒඊසී ගොඩනැගිල්ල, අංක 140, වොක්ෂෝල් වීදිය, කොළඹ 2

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

11-363

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

කොළඹ 3, ශාන්ත අන්තෝනි මාවතේ, ලකී ප්ලාසා, 70/14 බී හි සිය ලියාපදිංචි කාර්යාලය ඇති පුල්මේට් ඉංජිනියරින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ලියාපදිංචි අංක පී වී 108719 යටතේ 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සංස්ථාපනය කරන ලදී.

ලේකම්.

11-375

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මන්නාරම සින්නකඩය වයල් වීදියේ අංක 51 දරන නිවසේ පදිංචි අසුන්තා එඩෙල් ෂ්‍යාමලා ක්‍රිස්ටෝපර් වන මා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය යටතේ ජනතාවට මෙයින් දැනුම් දෙන්නේ 2011 සැප්තැම්බර් මස 26 වැනි දින මන්නාරම නීතිඥ හා නොතාරිස් වන එම් බී පාරූක් මහතා විසින් මන්නාරම මූර් වීදියේ පදිංචි සරවනමුත්තු ඉලංගයිරාජන් මහතා වෙත පවරන ලද අංක 9794 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

තව ද, එම ඇටර්නි බලපත්‍රය මගින් ඉදිරියේ දී සිදුවන කිසිදු ගනුදෙනුවක් සඳහා මා විසින් වගකියනු නොලබන බව මෙයින් දන්වා සිටිමි.

අසුන්තා එඩෙල් ෂ්‍යාමලා ක්‍රිස්ටෝපර්.

11-371

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

කොළඹ 3, ශාන්ත අන්තෝනි මාවතේ, ලකී ප්ලාසා 70/14 බී හි සිය ලියාපදිංචි කාර්යාලය ඇති ලියැන්ග් මා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 109007
ලියාපදිංචි දිනය : 2015 ඔක්තෝබර් මස 14 වැනි දින

ලේකම්.

11-376

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන ඇ වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු ගංගොඩවිල වලව්වත්ත පාරේ පිහිටි වරිපනම් අංක 43 සහ 43/1, දරන මිනින්දෝරු තැන්පත් කේ. ඒ. පෙරේරා මහතා විසින් සාදන ලද පිඹුරු අංක 383 සහ 2004.11.22 වැනි දින මැන සාදන ලද පුවක්ගහදෙණිය සහ පුවක්ගහඕවිට නැමැති ඉඩමෙන් බෙද වෙන් කරන ලද කැබලි අංක 01 ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතරයි හයයි. (අ. 0 රූඩ් 0 පර්. 30.46) සහ එහි තුළ පිහිටි වැව්ලි ගොඩනැගිල්ල ආදී සියලුම දේ ද සමග වේ. මාර්ග ප්‍රවේශ අයිතීන් ද සමග වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2015.11.29 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2013.10.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ රජයේ පුවත්පත් වන දිනමිණ, ඩේලි නිවුස් තිනකරන් පුවත්පත්හි වෙන්දේසි යෝජනාපත් වලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - දෙල්කඳ හන්දියේ සිට කොළඹ අවිස්සාවේල්ල ප්‍රධාන පාරේ රත්නපිටිය පාර දිගේ මීටර් 400ක් ගොස් වම් පැත්තේ ඇති වලව්වත්ත පාරේ මීටර් 100ක් දුර ගිය පසු මෙම ඉඩම පාරේ වම් පස පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය :*

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමනාකරු මහජන බැංකුව, ආයතනික ශාඛාව, ලේක් හවුස් ගොඩනැගිල්ල, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

දුරකථන අංක 011- 2423733, 011- 2437239 - 41

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනට ම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 0112 419126, 011 - 4280136
0723 - 3836742, 072 - 3207533.

11-313

---

**ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

2011 අංක 01 දරන විශේෂ විධිවිධාන පනත මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ වෙන්දේසි කිරීම

**අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුව තුළ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලංගම උතුර පිහිටි මුත්තෙට්ටුගොඩ පාරේ තක්සේරු අංක 55 දරන ''දෙල්ගහවත්ත '' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ඩබ්. මාකලන්ද විසින් මැන සාදන ලද 1979.02.04 දිනැති අංක 198 දරන පිඹුරේ සහ බලයලත් මිනින්දෝරු එල්. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් අනතුරුව සහතික කරන ලද 2004.05.25 දිනැති පිඹුරේ දක්වෙන බෙද වෙන් කළ බිම් කට්ටිය වන, පර්චස් දොළහක විශාලත්වයක් ඇති ලොට් අංක 1 දරන බිම් කට්ටියට අදල වටිනා දේපළ, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ ද ඇතුළත්ව වෙන්දේසිය.

*දේපළ විස්තරය.* - බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුව තුළ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලංගම උතුරෙහි පිහිටි, මුත්තෙට්ටුගොඩ පාරේ අංක 55 දරන, ''දෙල්ගහවත්ත'' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ඩබ්. මාකලන්ද විසින් මැන සාදන ලද 1979.02.04 දිනැති වඩාත් නිවැරදිව දක්වුවහොත් 1979.02.14 දිනැති අංක 198 දරන පිඹුරේ දක්වෙන සහ බලයලත් මිනින්දෝරු එල්. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් 2004.05.25 දතමින් පසුව සහතික කරන ලද පිඹුරේ දක්වෙන බෙද වෙන් කළ බිම් කට්ටිය වන, පර්චස් දෙළහක (අක්. 0 රූ. 0 පර්. 12) විශාලත්වයක් ඇති ලොට් අංක 1 නමැති ඉඩමට මායිම් ඊසානට ඩී. ඒ. ලූසානෝනාට අයත් ඉඩම ද, ගිණිකොණට මීට පෙර වස්තුහාමි යන අයට අයත්ව තිබූ දැනට එච්. ඒ. ඉසබෙලා යන අයට

අයත් ඉඩම ද, නිරිතට මුත්තෙට්ටුගොඩ පාර ද, වයඹට අඩි පහක් පළල පාර ද, යන මායිම් ඇතුළත පිහිටි ඉඩම හා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1634/03 යටතේ ලියාපදිංචි වී ඇත.

අංක 6 - A දෙවන පටුමග, ශ්‍රී සීලාලංකාර මාවත, මුල්ලේගම හෝමාගම පදිංචි වන්නිආරච්චිගේ චාමික දේවේන්ද්‍ර ෆොන්සේකා යන අය විසින් එන්. එච්. ජයවර්ධන නොතාරිස්තැනගේ 2008.02.29 දිනැති අංක 77 දරන උකස් බැඳුම්කරය මගින් මෙම දේපළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උකසට තබා ඇත.

*දේපළට ලඟා වීම.* - බත්තරමුල්ල නගරයේ සිට කඩුවෙල පාර ඔස්සේ යන විට තලාහේන මංසන්ධියට කිලෝමීටර 2.6ක් පමණ පෙර දකුණට ඇති මුත්තෙට්ටුගොඩ පාරෙහි මීටර 750ක් පමණ යන විට වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

මෙම දේපළ අප විසින් 2016 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්ද දින පෙරවරු 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් ගෙවීම් සිදු කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. ගැණුම් මිලෙන් 1%ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතු ය.
3. ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක ප්‍රතිශතයක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය.
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 29,000,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි ගාස්තුව වශයෙන් රු. 3,000 ක් ගෙවිය යුතු ය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතු ය.

*වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා .-* සහකාර සාමාන්‍යාධිකාරී (ණය), ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 - 2577994.

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්
වසර 122ක සේවා විශිෂ්ටත්වයක් සමරමින්.
www. sandslanka.com

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*අගනුවර කාර්යාලය හා වෙන්දේසි ස්ථානය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 2585408
ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

11-367

## ප්‍රසිද්ධ වෙන්දේසිය

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**අධ්‍යක්ෂ මණ්ඩල සම්මුතියේ 1 කොටසේ සඳහන් දේපළ**

*1 වන වෙන්දේසිය*

වැලිගම, හෙට්ටිවීදියේ පිහිටා ඇති පර්චස් 21.87 විශාලැති අගනා දේපලක්, දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ වැලිගම නගර සභා සීමාව තුළ හෙට්ටිවීදියේ පිහිටි ඉඩමට අංක 2074 දරන පිඹුරේ ලොට් A ලෙස දක්වෙන ලොට් 3 සහ 11 දරන කොටස් ඒකාබද්ධ වූ අලුත්තනගේවත්ත යන නමින් හඳුන්වනු ලබන පර්චස් 21.87 විශාලැති අගනා දේපළ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දනට සහ මින් මතුවට සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියළුම, නිශ්චල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායු සමීකරණ පද්ධතිය ද වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2015ක් වූ දෙසැම්බර් මස 4 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය .-* වැලිගම ප්‍රධාන බස් නැවතුම්පලේ සිට පැරණි ගාලු පාර ඔස්සේ මීටර් 200ක් පමණ ගමන් කර දකුණට ඇති ප්‍රධාන මාර්ගයට පිවිස මීටර් 300ක් පමණ ගමන්කර වමට පිහිටා ඇති හෙට්ටිවීදියට පිවිසීමෙන් නගර සභාව ඉදිරිපිට පාරේ වම් පසින් පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය :*

වැලිගම, පොල්වත්තේ පිහිටා ඇති පර්චස් 16.19 විශාලැති අගනා දේපළක්.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්වත්තේ පිහිටි ඉඩමට අංක 310 දරන පිඹුරේ ලොට් 15 ලෙස දක්වෙන ආඩිගේවත්ත යන නමින් හඳුන්වනු ලබන පර්චස් 16.19 විශාලැති අගනා දේපළ.

ඒ සමගම ඉහත කී ආඩිගේවත්ත දරන ඉඩමෙන් පිඹුරු අංක 310 පරිදි මැන බෙද වෙන් කරන ලද ලොට් 19 දරන ඉහත කී පරිදි පොල්වත්ත දරන ස්ථානයේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 25.21 දරන ඉඩම මතින් මාර්ග අයිතිය ද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ පරිශ්‍රයට දනට සහ මින් මතුවට සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම, නිශ්චල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායු සමීකරණ පද්ධතිය ද වේ.

වර්ෂ 2015ක් වූ දෙසැම්බර් මස 4 වැනි දින ප. ව. 12.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය .-* වැලිගම සිට කොළඹ මාතර ප්‍රධාන මාර්ගයේ පොල්වත්ත මංසන්ධිය දක්වා ගමන්කර එතැන් සිට වමට පිහිටා ඇති පොල්වත්ත පාරට හැරී මීටර් 450ක් පමණ පාලම පසුකරමින් ගමන් කර හන්දියෙන් වමට හැරී මීටර් 100ක් පමණ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් පිහිටා ඇති මෙම දේපළට ප්‍රවිෂ්ට විය හැකි ය.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇත්තාවූ අංක 436 දරන උකස් බැඳුම්කරය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීම වැලිගම වියානා මැරීන් අයිතිකරු වන කළුහෙන්නදිගේ නිහාල් නන්දන ද සිල්වා (ණයකරු) විසින් පැහැර හැර ඇති බැවින් ඉහත සඳහන් දේපළ නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ පිහිටි ස්ථානයන්හි දී පිළිවෙලින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :- (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, ගෙවිය යුතු වන අතර, විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත්කළ යුතු වේ.

*තෙවන වෙන්දේසිය .-* නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමට ලියා ඇති බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇත්තාවූ අංක 2011/GAL/TLF/2100/76 දරන උකස් බැඳුම්කරය යටතේ ගෙවිය යුතු මුදල් ගෙවීම වැලිගම වියානා මැරීන් අයිතිකරු වන කළුහෙන්නදිගේ නිහාල් නන්දන ද සිල්වා (ණයකරු) විසින් පැහැර හැර ඇති බැවින් ඉහත සඳහන් දේපළ නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත පහත ස්ථානයේ නවතා ඇති චංචල දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් 2015ක් වූ දෙසැම්බර් මස වැනි දින පස්වරු 12.45 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මිරිස්ස, මිරිස්ස වරාය සංකීර්ණය තුළ තබා හෝ ගබඩා කර හෝ නවතා ඇති අංග සම්පූර්ණ බහුදින අගනා ධීවර නෞකා දෙකක්.

*1 වන ධීවර නෞකාව* - ධීවර යාත්‍රාවේ දිග අඩි 40.03, බීම් -අඩි 12.02, ගැඹුර අඩි 07.03, ඩිසයින්ඩ් ඩ්‍රාෆ්ට්-අඩි 04.00, යාත්‍රාවේ වර්ගය මල්ටිඩේ යාත්‍රාව, එන්ජින් අංක 00969 ( ද 437), වර්ගය යන්මාර්, හෝර්ස් පවර් - 39HP බෝට්යාඩ් අංකය BVS/40V/48 යාත්‍රාවේ හල් උපකරණ සෑදීම සඳහා යොදාගත් ද්‍රව්‍ය - ෆයිබර් ග්ලාස්, හඳුනාගැනීමේ /ලියාපදිංචි අංකය IMUL - A - 0579-MTR පළමු ලියාපදිංචි කිරීමේ දිනය 2001.04.02.

2 වන ධීවර නෞකාව - ධීවර යාත්‍රාවේ දිග අඩි 40.06, බීම් - අඩි 13.06 ගැඹුරු අඩි 07.09, ඩිසයින්ඩ් ඩ්‍රාෆ්ට් - අඩි 03.08, යාත්‍රාවේ, වර්ගය මල්ටිඩේ යාත්‍රාව, එන්ජින් අංක 341612 ( ද 437) වර්ගය ලේලන්ඩ්, හෝර්ස් පවර් - 57 HP බෝට්යාඩ් අංකය SLB 313, යාත්‍රාවේ හල් උපකරණ සෑදීම සඳහා යොදගත් ද්‍රව්‍ය - ෆයිබර් ග්ලාස් හඳුනාගැනීමේ/ලියාපදිංචි අංකය IMUL - A - 0577 - MTR පළමු ලියාපදිංචි කිරීමේ දිනය 2006.10.11.

වැඩි විස්තර සඳහා කරුණාකර 2015.10.23 දී ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රය* හා 2015.10.09 දින ''ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල්'' පුවත්පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :- (1) සම්පූර්ණ ගැණුම් මුදල ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු මධ්‍යගත ණය ආපසු අයකිරීම්ගෙන් විමසන්න.

දුරකථන අංක : 2448448, 011 - 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 - , ෆැක්ස් : 2871184.

11-285

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

